වැන්දඹු පුරුෂ පනත

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
இலங்கைச் சனநாயக சோசலிசக் குடியரசு வர்த்தமானப் பத்திரிகை
The Gazette of the Democratic Socialist Republic of Sri Lanka
අති විශෙෂ அதிவிசேஷமானது EXTRAORDINARY

අංක 1179/24 – 2001 අප්‍රේල් 12 වැනි බ්‍රහස්පතින්දා – 2001.04.12
1179/24 ஆம் இலக்கம் – 2001 ஆம் ஆண்டு ஏப்ரில் மாதம் 12 ஆம் திகதி வியாழக்கிழமை
No. 1179/24 – THURSDAY, APRIL 12, 2001

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.) (அரசாங்கத்தின் அதிகாரத்துடன் பிரசுரிக்கப்பட்டது) (Published by Authority)

# I වැනි කොටස : (I) වැනි ඡේදය – සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

### 1998 අංක 60 දරන වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම (සන්නද්ධ හමුදා) පනත

1998 අංක 60 දරන වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රම (සන්නද්ධ බලසේනා) පනතේ 5 වන හා 8 වන වගන්ති වලින් තමන් වෙත පැවරී ඇති බලතල ප්‍රකාර රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු හා පරිපාලන ප්‍රතිසංස්කරණ ඇමතිවරයා විසින් පනවන ලද නියෝග.

රිචඩ් පතිරණ,
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු හා
පරිපාලන ප්‍රතිසංස්කරණ ඇමති.

2001 අප්‍රේල් මස 11 වැනි දින,
කොළඹ දී ය.

### නියෝග

1. මෙම නියෝග 2000 අංක 01 දරන වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් (සන්නද්ධ බලසේනා) නියෝග යනුවෙන් හැඳින්විය හැකිය.

2. (1) මේ නියෝග, 1983 අගෝස්තු මස 1 වන දින සිට බලපැවැත්විය යුතු අතර, එදින සිට එවා බලපැවැත්වුනු ලෙස සැලකිය යුතුය.

(2) පනතේ 3(1) වන වගන්තියේ කාර්යයන් සඳහා නියමිත දිනය 2003.04.10 වන දා විය යුතුයි.

3. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මෙම නියෝගවල 'පනත' යන්නෙන් 1998 අංක 60 දරන වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම (සන්නද්ධ හමුදා) පනත අදහස්වේ.

'විශ්‍රාම වැටුප් ලැබිය හැකි වයසේ ළමයා' යන්නෙන් :–

(අ) පිරිමියකු නම් වයසින් අවුරුදු 21ට අඩු තැනැත්තකු, හා

(ආ) ස්ත්‍රියක් නම් වයසින් අවුරුදු 21ට අඩු අවිවාහක තැනැත්තියක් දෙනස්වේ.

(ඇ) එසේ වුවද 1998.12.28 දිනෙන් පසු වයස අවුරුදු 21 හෝ ඊට වැඩි, පුරුෂ අනත් දරුවකු හෝ අවිවාහක අනත් දැරියක රැකියා විරහිතව සිටින කාලකදී ඔහුගේ හෝ ඇයගේ වයස අවුරුදු 26 වනතෙක් විශ්‍රාම වැටුප් ලැබිය හැකි ළමයකු ලෙස සැලකිය යුතුය.

IA – H 011484 – 1,400 (2001/04)

O KH HES R
Fwd for attn & necessary [illegible]
16/07

'හමුදාපතිවරයා' යන්න :-

(අ) ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නිලධාරියකු හෝ සෙබළියකු සම්බන්ධයෙහිලා ගත් කල්හි, එයින් යුද්ධ හමුදාපති අදහස් කෙරෙයි.

(ආ) ශ්‍රී ලංකා නාවික හමුදාවේ නිලධාරියකු හෝ සාමාන්‍ය නැවියකු සම්බන්ධයෙහිලා ගත් කල්හි, එයින් නාවික හමුදාපති අදහස් කෙරෙයි. තවද,

(ඇ) ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ නිලධාරියකු හෝ ගුවන් සාමාන්‍යයකු සම්බන්ධයෙහිලා ගත් කල්හි, එයින් ශ්‍රී ලංකා ගුවන් හමුදාපති අදහස් කෙරෙයි.

'දායක මුදල' යන්නෙන් විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට ගෙවනු ලබන දායක මුදලක් අදහස් වේ. 'අධ්‍යක්ෂ' යන්නෙන් විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ අදහස්වේ.

'වැටුප' යන්නෙන් -

(අ) 1983.08.01 වන දිනට පෙරාතුව වූ යම් කාල පරිච්ඡේදයක් සම්බන්ධයෙන් වූ විට, දායිකාවගේ නිත්‍ය තනතුරෙහි හෝ තාවකාලික තනතුරෙහි හෝ මූලික වැටුපෙන්, වඩා වැඩි වැටුප අදහස් වන නමුත්, දායිකාව විසින් ලබන්නට ඇති හෝ භුක්ති විඳින්නට ඇති දීමනා හෝ වෙනත් වේතන හෝ වෙනත් යම් ප්‍රතිලාභවල වටිනාකම හෝ එට ඇතුළත් නොවේ. තවද,

(ආ) 1983.08.01 වැනි දිනට පසුව යෙදෙන යම් කාල පරිච්ඡේදයක් සම්බන්ධයෙන් වූ විට, තම නිත්‍ය තනතුරෙහි හෝ තාවකාලික තනතුරෙහි 1983.08.01 වන දින දායිකාව විසින් ලබාගත හැකි වූ ඒකාබද්ධ වැටුප අදහස් වන නමුත් 1983.08.01 වන දින දායිකාව විසින් ලබන්නට ඇති හෝ භුක්ති විඳින්නට ඇති යම් දීමනා හෝ වෙනත් වේතන හෝ වෙනත් යම් ප්‍රතිලාභවල වටිනාකම හෝ එට ඇතුළත් නොවේ.

'ගණන් ගත හැකි සේවය' යන්න -

(අ) ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නිලධාරියකු හෝ සෙබළියකු සම්බන්ධයෙන් වූ විට, යුද්ධ හමුදා විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සඳහා ගණන් ගත හැකි සේවය අදහස් වන නමුත් එකී සංග්‍රහයේ 6 වන හා 25 වන නියෝග යටතේ ගණන් ගත හැකි දසවර්ෂ බෝනස් සේවා කාල එකතුව එට ඇතුළත් නොවේ.

(ආ) ශ්‍රී ලංකා නාවික හමුදාවේ යම් නිලධාරියකු හෝ සාමාන්‍ය නැවියකු සම්බන්ධයෙන් වූ විට නාවික හමුදා විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සඳහා ගණන් ගත හැකි සේවය අදහස් වන නමුත්, එකී සංග්‍රහයේ 6 වන හා 23 වන නියෝග යටතේ ගණන් ගත හැකි දසවර්ෂ බෝනස් සේවා කාල එකතුව එට ඇතුළත් නොවේ.

(ඇ) ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ යම් නිලධාරියකු හෝ ගුවන් සාමාන්‍යයකු සම්බන්ධයෙන් වූ විට ගුවන් හමුදා විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සඳහා ගණන් ගත හැකි සේවය අදහස් වන නමුත්, ඒ සංග්‍රහයේ 5 වන හා 23 වන නියෝග යටතේ ගණන් ගත හැකි දසවර්ෂ බෝනස් සේවා කාල එකතුව එට ඇතුළත් නොවේ.

'සේවා විශ්‍රාම වැටුප' යන්නෙන් අවස්ථාවෝචිත පරිදි යුද්ධ හමුදා විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික සංග්‍රහය හෝ නාවික හමුදා විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික සංග්‍රහය හෝ ගුවන් හමුදා විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික සංග්‍රහය යටතේ යම් තැනැත්තියකගේ ගණන් ගත හැකි සේවය සම්බන්ධයෙන් ඇයට ප්‍රදානය කෙරෙන විශ්‍රාම වැටුප් අදහස් වේ.

4. වැන්දඹු පුරුෂ හා අනත් දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට දායක වී ඇති, නොහොත් දායක වී ඇතැයි සැලකෙන සන්නද්ධ බලසේනාවල නැසීගිය සාමාජිකාවන්ගේ වැන්දඹු පුරුෂයන්ට හා අනත් දරුවන්ට මෙහි මින් මතු විධිවිධාන සැලැස්වෙන පරිදි විශ්‍රාම වැටුප් ප්‍රදානය කිරීම සඳහා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයක් පිහිටුවනු ලැබේ.

5. මේ නියෝග යටතේ මියගිය දායිකාවකගේ වැන්දඹු පුරුෂයකුට හෝ දරුවකුට හෝ දරුවන්ට ගෙවිය යුතු කිසිම විශ්‍රාම වැටුපක්, (241 වන අධිකාරය වන) බුද්ල් බදු ආඥාපනත යටතේ බුද්ල් බදු ගෙවීමට යටත් නොවිය යුතුය.

6. පනතේ 3(1) වන වගන්තිය යටතේ විශ්‍රාම වැටුප් ක්‍රමයට දායිකාවක වීමට තම කැමැත්ත ප්‍රකාශ කරන ලද හෝ කැමැත්ත ප්‍රකාශ කරන ලදැයි සලකනු ලබන සවර හෝ තැනැත්තියක 1983.08.01 වන දින සිට විශ්‍රාම වැටුප් ක්‍රමයට දායිකාවක බවට පත් වූ ලෙස සැලකිය යුතුය.

7. පනතේ (3) වන වගන්තියේ සඳහන් සවර හෝ තැනැත්තියක සන්නද්ධ බල සේනාවන්හි සමාජිකාවක බවට පත් වන දිනයේ සිට විශ්‍රාම වැටුප් ක්‍රමයේ දායිකාවක බවට පත් විය යුතුය.

8. සෑම දායිකාවකගේ ද, මෙම නියෝග යටතේ විශ්‍රාම වැටුපකට හිමිකම් ඇතිවිය හැකිවන සෑම දායිකාවකගේ ම ස්වාමි පුරුෂයාගේ සහ සෑම දරුවකුගේම උපන් දිනය ද සෑම දායිකාවක විසින් ගෙවන ලද දායක මුදල් පිළිබඳ සියලු විස්තර ද මෙම නියෝගවල කාර්යයන් සඳහා අවශ්‍ය විය හැකි වන දායිකාවන්ගේ සහ ඔවුන්ගේ වැටුප් වලට අයත් අයගේත් වෙනත් විස්තර ද ඇතුළත් වන ලේඛනයක් පවත්වාගෙන යාමට හමුදාපතිවරයා විසින් සලස්වනු ලැබිය යුතුය.

1998. අංක. 60 දරන වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් පනත (සංශෝධිත)

9. සෑම දායිකාවක විසින්ම මෙම නියෝග ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ වන දින සිට වසරක් ඇතුළත දී හෝ විශ්‍රාම වැටුප් ක්‍රමයට ඇය දායිකාවක වූ වසරක් ඇතුළත දී හෝ යන මින් කුමක් පසුව වන්නේ ද එදින සිට පහත සඳහන් විස්තර දැක්වෙන ප්‍රකාශයක් ඒ සඳහා නියමිත පත්‍රය මගින් හමුදාධිපතිවරයා වෙත සැපයිය යුතුය : –

(අ) ඇයගේ සම්පූර්ණ නම, නිලය හෝ තනතුර, රෙජිමේන්තු අංකය හා ඒකකය ;
(ආ) ඇයගේ උපන් දිනය;
(ඇ) විශ්‍රාම වැටුප් ක්‍රමයට ඇය දායිකාවක වන්නේ කවර දිනක සිට ද ? එම දිනය;
(ඈ) ඇය විවාහක නම්, විවාහ වූ දිනය ද, ඇගේ ස්වාමිපුරුෂයාගේ සම්පූර්ණ නාමය හා ඔහුගේ උපන් දිනය; හා
(ඉ) ඇයට දරුවන් සිටිනු සිටිත් නම්, ඒ එක් එක් දරුවාගේ සම්පූර්ණ නම, ස්ත්‍රී පුරුෂ භාවය සහ උපන් දිනය ;

10. දායිකාවක වශයෙන් සිටිය අතර විවාහ වන සෑම දායිකාවක විසින්ම ඇය විවාහ වූ දින සිට තුන් මාසයක් ඇතුළත දී පහත සඳහන් විස්තර දැක්වෙන ප්‍රකාශයක් තත්කාර්යය සඳහා වූ ආකෘති පත්‍රය මගින් හමුදාධිපතිවරයා වෙත සැපයිය යුතුය : –

(අ) ඇය විවාහ වූ දිනය ;
(ආ) ඇයගේ ස්වාමි පුරුෂයාගේ සම්පූර්ණ නාමය හා ඔහුගේ උපන් දිනය ;
(ඇ) ඇයගේ විවාහයට කලින් ඔහු නිසා ඇයට උපන් දරුවන් සිටිනු සිටිත් නම් එබඳු එක් එක් දරුවාගේ සම්පූර්ණ නම, ස්ත්‍රී පුරුෂ භාවය හා උපන් දිනය.

11. සෑම දායිකාවක විසින්ම –

(අ) ඇයට දරුවකු උපන් විට එම උපත වූ දින සිට මාස තුනක් ඇතුළත දී එම දරුවාගේ සම්පූර්ණ නම ද උපන් දිනය හා ස්ත්‍රී පුරුෂ භාවය ද ඒ සඳහා නියමිත ආකෘති පත්‍රය මගින් හමුදාධිපතිවරයා වෙත සැපයිය යුතුය;
(ආ) වයසින් අවුරුදු විසිහයකට අඩුවන ඇගේ දරුවකු විවාහ වූ විට විවාහය සිදු වූ දින සිට මාස තුනක් ඇතුළත දී ඒ සඳහා නියමිත ආකෘති පත්‍රය මගින් එම දරුවාගේ සම්පූර්ණ නම සහ විවාහය සිදු වූ දිනය හමුදාධිපතිවරයා වෙත දැනුම් දිය යුතුය..
(ඇ) ඇයගේ ස්වාමියාගේ හෝ විශ්‍රාම වැටුප් ලැබිය හැකි දරුවකුගේ හෝ මරණය සිදුවුවහොත් එම මරණය සිදු වී මාස තුනක් ඇතුළත දී එසේ මියගිය ස්වාමියාගේ හෝ දරුවාගේ හෝ සම්පූර්ණ නම හා මරණය සිදු වූ දිනය ඒ සඳහා නියමිත ආකෘති පත්‍රය මගින් හමුදාධිපතිවරයා වෙත දැනුම් දිය යුතු ය. තවද,
(ඈ) බලය ඇති අධිකරණයක තීන්දුවක් මගින් ඇයගේ විවාහය නිෂ්ප්‍රභ කර එසේ නැතහොත් අවලංගු කළහොත්, එම නිෂ්ප්‍රභ කිරීම හෝ අවලංගු කිරීම හෝ කළ දින සිට මාස තුනක් ඇතුළත දී ඇගේ ස්වාමිපුරුෂයාගේ සම්පූර්ණ නම හා එම නිෂ්ප්‍රභා කිරීමේ හෝ අවලංගු කිරීමේ හෝ දිනය, ඒ සඳහා නියමිත ආකෘති පත්‍රය මගින් හමුදාධිපතිවරයා වෙත දැනුම් දිය යුතුය.

12. (1) දායිකාවගේ වැන්දඹු පුරුෂයා විසින් : –

(අ) එම දායිකාවගේ මරණය සිදු වූ අවස්ථාවක එම මරණය සිදු වූ දින සිට මාස තුනක් ඇතුළත දී ඇගේ මරණය සිදු වූ දිනය ඒ සඳහා නියමිත ආකෘති පත්‍රය මගින් හමුදාධිපතිවරයා වෙත දැනුම් දිය යුතුය ;
(ආ) වයසින් අවුරුදු විසි හයකට අඩුවෙන් සිටිය දී, එම දායිකාවගේ යම් ඇගේ දරුවකු විවාහ වූ විට, ඒ විවාහය සිදු වී මාස තුනක් ඇතුළත දී එම දරුවාගේ සම්පූර්ණ නම හා ඇය විවාහ වූ දිනය, ඒ සඳහා නියමිත ආකෘති පත්‍රයක් මගින් හමුදාධිපතිවරයා වෙත දැනුම් දිය යුතුය ;
(ඇ) එම දායිකාවගේ යම් කිසි දරුවකු විශ්‍රාම වැටුපක් ලැබිය හැකි වයසේ සිටිය දී මරණයට පත්වුවහොත්, එම මරණය සිදු වූ දින සිට මාස තුනක් ඇතුළත දී එම දරුවාගේ සම්පූර්ණ නම, ස්ත්‍රී පුරුෂ භාවය හා මරණය සිදු වූ දිනය, ඒ සඳහා නියමිත ආකෘති පත්‍රය මගින් හමුදාධිපතිවරයා වෙත දැනුම් දිය යුතුය ; සහ
(ඈ) ඔහුගේ නැවත විවාහයක් සිදුවුවහොත්, එම නැවත විවාහය සිදු වූ දින සිට මාස තුනක් ඇතුළත දී ඒ සඳහා නියමිත ආකෘති පත්‍රය මගින් හමුදාධිපතිවරයා වෙත දැනුම් දිය යුතුය.

(2) මෙම නියෝගයේ (1) (අ) ඡේදය යටතේ යම්කිසි දායිකාවකගේ වැන්දඹු පුරුෂයකු විසින් කළ යුතු දැනුම් දීම සඳහා දායිකාවගේ ඇවෑමෙන් වැන්දඹු පුරුෂයා නොසිටියහොත්, දායිකාවගේ ළඟම ඥාතිවරයා විසින් එම දැනුම් දීම කළ යුතුය.

(3) මෙම නියෝගයේ (1) (ආ) සහ 1 (ඇ) ඡේද යටතේ වැන්දඹු පුරුෂයා විසින් කළ යුතු ඇති දැනුම් දීම සඳහා, එවැනි දරුවකුගේ විවාහය හෝ මරණය හෝ සිදුවන අවස්ථාවේ වැන්දඹු පුරුෂයා ජීවත්ව නොසිටියහොත් අවස්ථාවෝචිත පරිදි, ඒ දරුවාගේ විවාහය හෝ මරණය සිදුවීමට පෙරාතුවම ඒ දරුවාගේ භාරකරු වශයෙන් සිටි තැනැත්තා විසින් එම දැනුම් දීම කළ යුතුය.

13. මෙම නියෝග යටතේ ප්‍රකාශයක් හෝ දැනුම් දීමක් කරන සෑම දායිකාවකම හෝ අන් තැනැත්තකු විසින් ඒ ප්‍රකාශයේ හෝ දැනුම් දීමේ අඩංගු කරුණු සනාථ කිරීම සඳහා හමුදාධිපතිවරයා විසින් නියම කළ හැකි සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

14. මෙම නියෝග යටතේ හෝ හමුදාධිපතිවරයා විසින් නියම කරන පරිදි හෝ සැපයිය යුතුව ඇති ප්‍රකාශ, දැනුම් දීම් හා වෙනත් විස්තර හමුදාධිපතිවරයා වෙත සැපයිය යුත්තේ –

(අ) සේවයේ යෙදී සිටින දායිකාවක සම්බන්ධයෙන් වනකල, අවස්ථාවෝචිත පරිදි ඇයගේ ඒකකයේ, නැවේ හෝ සේවා ස්ථානයේ අණදෙන නිලධාරී මගින් හමුදාධිපතිවරයා වෙතය.

(ආ) අන් යම් කැනැත්තියක සම්බන්ධයෙන් වනකල, ඉදුරාම හමුදාධිපතිවරයා වෙතය.

15. (1) සෑම දායිකාවකම විසින්ම තම එකාබද්ධ වැටුපෙන් අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන ප්‍රතිශතයකට අනුව මාසික දායක මුදල්, විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවනු ලැබිය යුතුය.

(2) මෙම නියෝගය යටතේ ගෙවිය යුතු දායක මුදල් දිනපතා එකතු විය යුතු අතර, දායිකාවගේ වැටුපෙන් එය මාසපතා අඩු කර ගත යුතුය.

(3) දායිකාවක හට යම්කිසි මසක දී සම්පූර්ණ වැටුපට හිමිකම් ඇති නොවන විට, ඇගේ දායක මුදල් අය කර ගත යුත්තේ එම මාසය සඳහා ඇය නියම වශයෙන් ලැබීමට හිමිකම ඇති වැටුප මත වේ. යම් මසක දී ඇයට කිසිම වැටුපක් අහිමි වුවහොත් එ මාසය සඳහා ඇයගෙන් දායක මුදල් අයකර නොගත යුතුය.

(4) විශ්‍රාම වැටුප් සඳහා දායක මුදල් අඩුකර ගැනීම දායිකාවගේ වැටුපෙන් පළමුවෙන්ම කෙරෙන අය කිරීමක් විය යුතුය.

(5) දායිකාවගෙන් දායක මුදල් අයකර ගත යුත්තේ ඇය සන්නද්ධ බල සේවාවන්හි සාමාජිකාවකව සිටින තාක් කල් පමණකි.

16. (1) තමා දායිකාවක වන දිනට කලින් කළා වූ ගණන් ගත හැකි සේවයක් ඇති සෑම දායිකාවකම විසින්, ඇයගේ කැමැත්ත පරිදි මෙහි මීට පසුව දක්වා ඇති අන්දමට එම සේවය සම්බන්ධයෙන් අදාළ දායක මුදල් ඊට අයත් පොලියත් සමඟ ගෙවිය හැකිය.

(2) (1) වන ඡේදයේ සඳහන් පරිදි කළා දායිකාවක වන දිනට කලින් කළා වූ ගණන් ගත හැකි සේවයේ එක් එක් සම්පූර්ණ මාසය සඳහා දායිකාවක විසින් ගෙවිය යුතු දායක මුදල විය යුත්තේ, මෙහි (3) වන ඡේදයේ (අ) සහ (ආ) අනුඡේදයන්හි සඳහන් දායක මුදල්වල එකතුව, එසේ ගණන් ගත හැකි සේවා කාලය තුළ ඇති සම්පූර්ණ කළ මාස ගණනින් බෙදා එන ප්‍රමාණය වේ.

(3) තමා දායිකාවක වන දිනට කලින් කළා වූ ගණන් ගත හැකි සේවය සඳහා දායිකාවක විසින් ගෙවිය යුතු දායක මුදල්, පහත සඳහන් පරිදි ගණන් බැලිය යුතුය :-

(අ) 1983 අගෝස්තු මස 1 වන දිනට පෙර, ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට අයත් නිත්‍ය බල සේනාවේ, ශ්‍රී ලංකා නාවික හමුදාවට අයත් නිත්‍ය නාවික බල සේනාවේ හෝ ශ්‍රී ලංකා ගුවන් හමුදාවට අයත් නිත්‍ය ගුවන් බල සේනාවේ සේවය කළ ගණන් ගත හැකි යම් සේවා කාලයක් හෝ සේවාකාල සඳහා ගෙවිය යුතු දායක මුදල් විය යුත්තේ, එම සම්පූර්ණ සේවා කාලය සඳහා දායිකාව ලැබූ වැටුපේ දෙකෙන් සියට හතරකි.

(ආ) ඇය දායිකාවක වන දිනට කලින් ලත්, මෙම ඡේදයේ (අ) අනුඡේදයේ සඳහන් වන ගණන් ගත හැකි සේවය නොවන වෙනත් ගණන් ගත හැකි සේවාකාලයක හෝ කාල සම්බන්ධයෙන් දායක මුදල් අය කරන ප්‍රමාණය විය යුත්තේ එම සේවයේ සම්පූර්ණ කළ සෑම මාසයක් සඳහා, අදාළ පරිදි, ශ්‍රී ලංකා යුධ හමුදාවේ නිත්‍ය බල සේනාවට හෝ ශ්‍රී ලංකා නාවික හමුදාවේ නිත්‍ය නාවික හමුදාවට හෝ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ නිත්‍ය ගුවන් බල සේනාවට හෝ දායිකාව බැඳුන දිනයේ දී ලබමින් සිටි මාසික වැටුපෙන් සියයට හතර බැගින් ය.

(4) මෙම නියෝගයන්හි (3) වන ඡේදයේ (අ) සහ (ආ) යන අනුඡේද වල සඳහන් දායක මුදල් මත අවුරුද්දකට සියයට හතර බැගින් වන වැල් පොලියක් 1983 අගෝස්තු මස 1 වන දින හෝ ඇය දායිකාවක බවට පත් වූ දින හෝ යන මින් කවර දිනයක් පසුව වන්නේ ද එදින සිට, එම දායක මුදල් ගෙවන දිනය වන තෙක් දායිකාව විසින් ගෙවිය යුතුය :

එසේ වුවද, දායිකාව හට ඇයගේ සේවා විශ්‍රාම වැටුප වෙනුවෙන් ගෙවිය යුතු පරිවර්තිත පාරිතෝෂිකයන් දායිකාව විසින් එම දායක මුදල් ගෙවන අවස්ථාවක දී වැල් පොලිය ගෙවිය යුත්තේ ඇය විශ්‍රාම ගන්නා දිනය ද ඇතුළුව එදින දක්වා පමණකි.

(5) මෙම නියෝගයේ (3) වන හා (4) වන ඡේදයන්හි සඳහන් වන දායක මුදල් හා පොලිය, මෙම නියෝගයන්හි වූ පටහැනි යමක් කිසිවක් නොසලකා, මෙහි පහත දැක්වෙන පරිදි දායිකාව විසින් ගෙවිය යුතුය :

(අ) සන්නද්ධ බලසේනාවන්හි සාමාජිකාවක වශයෙන් ඇයගේ සේවාකාලය තුළ යම් අවස්ථාවක දී හෝ ඊට පසුව හෝ මුළු මුදල වශයෙන් එක් වරක දී, හෝ

(ආ) එක් කොටසක් ඇයගේ සේවා විශ්‍රාම වැටුප වෙනුවෙන් ගෙවිය යුතු පරිවර්තිත පාරිතෝෂිකයෙන් ද, ඉතිරිය, ඇය සන්නද්ධ බලසේනාවන්හි සාමාජිකාවකව සිටීම නිම කළ දිනයේ දී දායක මුදල් අයකර ගන්නා ලද මාසික අනුපාතික ප්‍රමාණයට හෝ දායිකාව හා අධ්‍යක්ෂ එකඟ වන ඊට වැඩි යම් ප්‍රමාණයක මාසික අනුපාතයට සමාන මාසික කොටස් මුදල් වශයෙන් ඇයගේ සේවා විශ්‍රාම වැටුපෙන් ද අය කර ගත යුතුය.

(6) යම් දායිකාවක විසින් එසේ දායිකාවක වන දිනට කලින් ලබා ඇති ඇයගේ ගණන් ගත හැකි සේවය සම්බන්ධයෙන් මෙම නියෝගයේ (5) වන ඡේදයෙහි (ආ) අනුඡේදයෙහි දක්වා ඇති පරිදි දායක මුදල් සහ පොලිය ගෙවන විට -

(අ) ඇයගේ සේවා විශ්‍රාම වැටුපෙන් එම ගෙවීම නතර කිරීමට ඇය අදහස් කරන්නේ නම්, ඒ බව, ඉතිරි දායක මුදල් හා පොලිය ගෙවා අවසන් කිරීමට පෙර ඕනෑම අවස්ථාවක දී, ඒ සඳහා නියමිත ආකෘති පත්‍රය මගින් හමුදාධිපතිවරයා වෙත දැනුම් දිය ඇය විසින් කළ හැක. එම දැනුම් දීම හමුදාධිපතිවරයා වෙත ලැබුණු විට, එම දැනුම් දීම ඇය විසින් කළ මාසයට පසුව එන මාසයේ සිට, දායිකාවගේ සේවා විශ්‍රාම වැටුපෙන් දායකමුදල් සහ පොලිය අයකර ගැනීම හමුදාධිපතිවරයා විසින් නතර කළ යුතුය.

(ආ) දායිකාවක ඉතුරු දායක මුදල හා පොලිය ගෙවා අවසන් කිරීමට පෙර යම් දිනක විශ්‍රාම වැටුප් ලැබිය හැකි දරුවන් නොමැති වැන්දඹුවකු වුවහොත්, ඇය එසේ වැන්දඹුවකු වූ දින සිට ඇයගේ සේවා විශ්‍රාම වැටුපෙන් දායක මුදල් සහ පොලිය අයකර ගැනීම නතර කළ යුතුය.

(7) දායිකාවක එසේ දායිකාවක වූ දිනට කලින් කළා වූ ගණන් ගත හැකි සේවය සඳහා දායක මුදල් සහ පොලිය ගෙවා නැති අවස්ථාවක දී හෝ ඉන් කොටසක් පමණක් ගෙවා ඇති අවස්ථාවක දී හෝ, අධ්‍යක්ෂ විසින් තම අභිමතය පරිදි තීරණය කරනු ලබන අන්දමකට, අවස්ථාවෝචිත පරිදි, එම දායක මුදල් හා පොලිය සම්පූර්ණ වශයෙන් හෝ ගෙවා නොමැති එහි ඉතිරි කොටස හෝ ගෙවීම, එබඳු දායිකාවකගේ වැන්දඹු පුරුෂයා විසින් කළ හැකිය.

(8) පනතේ 3 වන වගන්තියට අනුව විශ්‍රාම වැටුප් ක්‍රමයට දායිකාවක වීමට තෝරා ගනු ලැබ ඇතැයි පළකරනු ලබන සන්නද්ධ බල සේවාවන්හි සාමාජිකාවක පිළිබඳ වන විට, ඇය දායිකාවක බවට පත් වී ඇතැයි සලකනු ලබන දිනට කලින් ලත් ගණන් ගත හැකි සේවා කාලය සම්බන්ධයෙන් වන දායක මුදල් හා පොලිය, අධ්‍යක්ෂ විසින් තීරණය කරනු ලබන අන්දමකට, එබඳු දායිකාවකගේ වැන්දඹු පුරුෂයා විසින් ගෙවිය හැකිය.

17. දායිකාවක -

(අ) විශ්‍රාම ගැනීම, අස් කිරීම, ඉල්ලා අස්වීම, පහකිරීම හෝ වෙනයම් හේතුවක් කරණකොට ගෙන සන්නද්ධ බලසේනාවන්හි සාමාජිකාවක වීම නැවතුන කල්හි

හෝ

(ආ) මියගිය කල්හි

යන සිදුවීම් වලින් පළමුවෙන් ඇතිවන සිද්ධියේ දී සිට ඇයගේ දායක මුදල් ඇයගේ වැටුපෙන් අයකර ගැනීම නැවැත්විය යුතුය.

18. දායිකාවක විසින් ගෙවනු ලැබූ දායක මුදල් සියල්ල සහ ඊට අය වූ පොලිය ද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඒකාබද්ධ අරමුදලට ගෙවිය යුතුය.

19. සන්නද්ධ බලසේනාවල සාමාජිකාවක වශයෙන් සේවයෙහි යෙදී සිටිය දී 1983 අගෝස්තු මස 1 වන දින හෝ එදිනට පසුව මිය යන විට හෝ දුබලතා හේතුන් මත එම සේවයෙන් ඉවත් කරනු ලැබීමෙන් පසුව හෝ විශ්‍රාම වැටුප් මත එම සේවයෙන් විශ්‍රාම ගැනීමෙන් පසුව හෝ දායිකාවක සම්බන්ධයෙන් ගෙවිය හැකි විශ්‍රාම වැටුප් ප්‍රමාණය, 20 වන නියෝගයේ (2) වන ඡේදයේ විධිවිධාන වලට යටත්ව (357 වන අධිකාරය වූ) යුද්ධ හමුදා පනත යටතේ කලින් කල සාදන ලද යුද්ධ හමුදා විශ්‍රාම වැටුප් සහ පාරිතෝෂික සංග්‍රහය යටතේ දායිකාවට ලැබිය හැකිව තිබුණු විශ්‍රාම වැටුපම වන අතර, ඒ කාර්යය සඳහා -

(අ) සේවයේ යෙදී සිටිය දී මිය යාම සිදුවන අවස්ථාවේ දී ගණන් ගත හැකි සේවා කාලය එම දායිකාවට අදාළ විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික දීමනා ව්‍යවස්ථා සංග්‍රහයේ රෙගුලාසි ප්‍රකාරව විශ්‍රාම වැටුපක් ලැබීමට හිමිකම් ඇති ගණන් ගත හැකි සේවා කාලයක් සම්පූර්ණ කර ඇති අයකු සේ සලකා ඊ අනුව ගණන් බලන ලද විශ්‍රාම වැටුපක් ඇයට ප්‍රදානය කොට දුබලතා හේතූන් මත ඇය සේවයෙන් ඉවත් කරනු ලැබ ඇති ලෙස සැලකිය යුතුය.

(ආ) දායිකාවක සේවයේ යෙදී සිටිය දී මියයාම සිදුවන අවස්ථාවේ දී ගණන් ගත හැකි සේවා කාලය ඇයට අදාළ විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික දීමනා ව්‍යවස්ථා සංග්‍රහයේ රෙගුලාසි ප්‍රකාරව විශ්‍රාම වැටුපක් ලැබීමට හිමිකම් ඇති ගණන් ගත හැකි සේවා කාලයට වැඩිවන අවස්ථාවක, ගෙවිය හැකි විශ්‍රාම වැටුප දුබලතා හේතූන් මත ඇය සේවයෙන් ඉවත් කරනු ලැබුවහොත් එම සේවා කාලය සඳහා එම දායිකාවට ලබාගත හැකිව තිබුණු විශ්‍රාම වැටුප විය යුතුය.

(ඇ) විශ්‍රාම ගැනීමෙන් පසු හෝ විශ්‍රාම ගැනීම සඳහා අනිවාර්ය වයසට එළඹීම හේතුවෙන් නැතහොත් වෙනත් යම් හේතුවක් මත විශ්‍රාම ගැන්වීමෙන් පසු හෝ එවැනි තැනැත්තියකු මියයන අවස්ථාවක දී ඇය විශ්‍රාම ගන්නා විට විශ්‍රාම වැටුපක් ලැබීමට සුදුසුකම් ලබා සිටියේ නම් හෝ ඇයගේ වැන්දඹු පුරුෂයාට ගෙවිය යුතු විශ්‍රාම වැටුප විශ්‍රාම ගන්නා විට ඇය ලැබීමට සුදුසුකම් ලබා සිටි විශ්‍රාම වැටුප විය යුතුය. තවද ;

(ඈ) දුබලතා හේතූන් මත සේවයෙන් ඉවත් කරනු ලැබූ එවැනි තැනැත්තියක මියයන අවස්ථාවක ඇය අවුරුදු දහයකට අඩු ගණන් ගත හැකි සේවයක් ඇති නිලධාරිණියක නම් හෝ අවුරුදු දොළහකට අඩු ගණන් ගත හැකි සේවයක් ඇති සෙසු නිලධාරිනියක් නම් හෝ ඇයට ගෙවිය හැකි විශ්‍රාම වැටුප අවස්ථාවෝචිත පරිදි ඇයට අවුරුදු දහයක ගණන් ගත හැකි සේවයක් හෝ අවුරුදු දොළහක ගණන් ගත හැකි සේවයක් හෝ තිබී දුබලතා හේතූන් මත සේවයෙන් ඉවත් කරනු ලැබුයේ නම් ඇයට ලබාගත හැකිව තිබුණු විශ්‍රාම වැටුප විය යුතුය.

20. සන්නද්ධ බලසේනාවන්හි සාමාජිකාවක විශ්‍රාම වැටුප් ක්‍රමයේ දායිකාවක වන දිනට පෙර කරන ලද ගණන් ගත හැකි සේවය වෙනුවෙන් දායක මුදල් සහ පොලිය ගෙවනු නොලැබූ කල්හි මෙම නියෝගයේ (1) වන ඡේදයේ (අ) හෝ (ආ) උප ඡේදය අනුව ගෙවනු ලබන අවසාන වැටුප ...ත පදනම් ; විශ්‍රාම වැටුප, අවස්ථාවෝචිත පරිදි දායක මුදල් ගෙවා නොමැති එම ගණන් ගත හැකි සම්පූර්ණ කරන ලද එක් එක් අවුරුද්ද සඳහා 1/50 බැගින්ද, අවුරුද්දට අඩු සේවා කාලයක් වූ විට සම්පූර්ණ කරන ලද එක් එක් මාසය සඳහා 1/600, බැගින්ද අඩුකළ යුතුය.

(1) මෙම නියෝග යටතේ ගෙවිය යුතු සෑම විශ්‍රාම වැටුපක්ම ගෙවීම, එම විශ්‍රාම වැටුප ගෙවිය යුතු වූ දායිකාවගේ මරණය සිදු වූ දිනට පසු දින සිට ආරම්භ විය යුතු අතර, එය දිනපතා එකතු විය යුතු අතර මාස්පතා ගෙවිය යුතුය.

(2) මෙම නියෝගයන්හි මෙහි අතුරකින් විශේෂයෙන් විධිවිධාන සලසන ලද අවස්ථාවන්හි හැර දායිකාවකගේ අර්ථලාභීන් විය යුත්තේ ඇයගේ –

(අ) වැන්දඹු පුරුෂයා, සහ
(ආ) අතක් දරුවන්ය.

එසේ වුවද විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා එක විවාහයකින් ලත් දරුවන් දෙදෙනා හෝ ඊට වැඩි ගණනක් එක අර්ථලාභියකු වශයෙන් සැලකිය යුතුය.

21. (1) දායිකාවකගේ වැන්දඹු පුරුෂයා 22 වන නියෝගයේ විධිවිධානවලට යටත්ව 19 වන නියෝගවලට අනුකූලව ගණන් බලන ලද විශ්‍රාම වැටුපකට හිමිකම් ලැබිය යුතුය.

(2) යම් දායිකාවක් නැවත විවාහ නොවූ වැන්දඹුවක ලෙස මේ නියෝග යටතේ විශ්‍රාම වැටුපට අයිතිවාසිකම් ඇති දරුවකු හෝ දරුවන් ජීවත්ව සිටියදී මියගිය අවස්ථාවක හෝ යම් දායිකාවකගේ වැන්දඹු පුරුෂයෙක් ඒ දායිකාව සමග වූ ඔහුගේ විවාහයෙන් ලැබුණු සහ මේ නියෝග යටතේ විශ්‍රාම වැටුපට අයිතිවාසිකම් ඇති දරුවකු හෝ දරුවන් ජීවත්ව සිටියදී මියගිය අවස්ථාවක, ඒ දරුවාගේ හෝ දරුවන්ගේ විශ්‍රාම වැටුප, ඒ වැන්දඹු පුරුෂයාට ලැබිය යුතුව තිබූ හෝ ඔහු ලබමින් සිටි හෝ මුදල් ප්‍රමාණය විය යුතු අතර එය දරුවන් අතරේ සමානව බෙදිය යුතුය.

22. දායිකාවගේ වැන්දඹු පුරුෂයා නැවත විවාහ වුවහොත් එසේ ඔහු නැවත විවාහ වූ දින සිට මෙම නියෝග යටතේ කිසිම විශ්‍රාම වැටුපක් ඔහුට නොලැබිය යුතුය.

23. (1) 22 වන නියෝගයේ විධිවිධාන ප්‍රකාර වැන්දඹු පුරුෂයකුට විශ්‍රාම වැටුප් ගෙවීම නතර කරන කල්හි හෝ විශ්‍රාම වැටුපක් හිමි වැන්දඹු පුරුෂයකු මිය යන කල්හි :-

(අ) එම විවාහයෙන් ඉපදුන විශ්‍රාම වැටුප් ලැබිය හැකි වයසේ යම්කිසි දරුවෙකු හෝ දරුවන් සිටිත් නම් ඔහුට ගෙවනු ලැබූ විශ්‍රාම වැටුප, අවස්ථාවෝචිත පරිදි, එවැනි දරුවා හෝ දරුවන් අතර සම කොටස් වශයෙන් ගෙවිය යුතුය; නැතහොත්

(ආ) දායිකාවට එවැනි දරුවකු හෝ දරුවන් නොමැති විටක දී කලින් විවාහයකින් ලත් විශ්‍රාම වැටුප් ලැබීමට සුදුසු දරුවන් සිටින්නම්, එම විශ්‍රාම වැටුප සම කොටස් වශයෙන් ඔවුන්ට ගෙවිය යුතුය. එවැනි දරුවන් නොමැති නම් විශ්‍රාම වැටුප අවලංගු විය යුතුය ;

(2) යම් විවාහයකින් දායිකාවකගේ එක දරුවකු පමණක් සිටින කල හා එම දරුවාට මෙම නියෝගයේ විශ්‍රාම වැටුපක් හිමිවන කල, එවැනි දරුවාගේ විශ්‍රාම වැටුප විය යුත්තේ ඒ දරුවාගේ පියාණන්ට ලැබුණ හෝ ඔහුට ගෙවිය යුතු වූවානම් ඔහුට ලැබෙන්නට තිබුණ විශ්‍රාම වැටුප් ප්‍රමාණයම වන අතර, ඒ දරුවා විශ්‍රාම වැටුප් ලැබිය හැකි වයස ඉක්මයාම හෝ ඒ දරුවා මිය යාම යන සිද්ධීන් දෙකකින් කලින් සිදුවන සිද්ධියේ දී එම විශ්‍රාම වැටුප අවලංගු විය යුතුය.

(3) දායිකාවකගේ එකම විවාහයකින් ලත් මෙම නියෝග යටතේ විශ්‍රාම වැටුපකට හිමිකම් ඇති දරුවන් දෙදෙනකු හෝ ඊට වැඩි දරුවන් ගණනක් සිටින කල ඔවුන්ට ගෙවිය යුතු විශ්‍රාම වැටුප විය යුත්තේ ඔවුන්ගේ පියාණන්ට ලැබුණ හෝ ඔහුට ගෙවිය යුතු වූවානම් ඔහුට ලැබෙන්නට තිබුණ ප්‍රමාණයම වන අතර, විශ්‍රාම වැටුප සම කොටස් වශයෙන් එම දරුවන් අතර බෙදා දිය යුතුය. එම දරුවන්ගෙන් යම්කිසිවකු විශ්‍රාම වැටුප් ලැබිය හැකි වයස ඉක්මවන කල හෝ මිය යන කල ඒ දරුවාගේ එම විශ්‍රාම වැටුප් කොටස එම විවාහයෙන් ලත් විශ්‍රාම වැටුප් ලැබීමට සුදුසුකම් ඇති ජීවත්ව සිටින දරුවා හෝ දරුවන් වෙත අවස්ථාවෝචිත පරිදි, සම කොටස් වලින් ගෙවිය යුතුය.

24. කලින් විවාහයකින් ලත් විශ්‍රාම වැටුප් ලැබිය හැකි වයසේ දරුවන් සහ වැන්දඹු පුරුෂයකු සිටිය දී දායිකාව මිය යන කල, 19 වන නියෝගය ප්‍රකාර ගණන් ගන්නා ලද විශ්‍රාම වැටුපෙන් එක භාගයක් වැන්දඹු පුරුෂයාට හිමි විය යුතු අතර විශ්‍රාම වැටුපේ අනික් භාගය සම කොටස් වලින්, කලින් සිදුවූ විවාහයෙන් ලත් විශ්‍රාම වැටුප් ලැබිය හැකි වයසේ සිටින දරුවන්ට හිමි විය යුතුය. වැන්දඹු පුරුෂයා නැවත විවාහ වුවහොත් හෝ දායිකාව සමග වූ විවාහයෙන් විශ්‍රාම ලැබිය හැකි වයසේ දරුවන් නොමැතිව මිය ගිය හොත්, ඔහුට ගෙවනු ලැබූ විශ්‍රාම වැටුප් ප්‍රමාණය දායිකාව කලින් සිදුවූ විවාහයේ, විශ්‍රාම වැටුප් ලැබිය හැකි වයසේ සිටින දරුවන් අතර සම කොටස් වලින් බෙදිය යුතුය. දායිකාව සමග වූ විවාහයෙන් විශ්‍රාම වැටුප් ලැබිය හැකි වයසේ දරුවන් ඇතිව වැන්දඹු පුරුෂයා මිය ගියා නම් ඔහුට ගෙවනු ලැබූ විශ්‍රාම වැටුප් ප්‍රමාණය, එවැනි දරුවන් අතර සම කොටස්වලින් බෙදිය යුතුය. කලින් සිදුවූ විවාහයේ විශ්‍රාම වැටුප් ලැබිය හැකි වයසේ සිටින දරුවන් අතුරින් ඉතාමත් බාලයා විශ්‍රාම වැටුප් ලැබිය හැකි වයස ඉක්මවන කල විශ්‍රාම වැටුපෙන් එම දරුවාට ගෙවිය යුතුව තිබුණ ප්‍රමාණය වැන්දඹු පුරුෂයාට ගෙවිය යුතුය.

25. දායිකාව විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවීම නැවැත්වීමෙන් පසු ඇය සමග කල විවාහයකින් ශේෂ වන වැන්දඹු පුරුෂයකුට එවැනි විවාහයකින් ඇති වන දරුවකුට මෙම නියෝග යටතේ කිසිම විශ්‍රාම වැටුපක් හිමි විය යුත්තේ හෝ හිමි වන්නේ ද නැත.

26. (1) මෙහි මින්මතු සලසවන විධිවිධාන පරිදි හැර දායිකාවක විවාහවීමෙන් දොළොස් මසක් ඇතුළත ඇය මියයන කල හා එවැනි විවාහයකින් දරුවන් නොමැති කල, මෙම නියෝග යටතේ ඇයගේ වැන්දඹු පුරුෂයා, විශ්‍රාම වැටුප් කාර්යයන් සඳහා අර්ථලාභියෙක් හෝ විශ්‍රාම

වැටුපකට හිමි කරුවෙක් හෝ නොවිය යුතුය. එසේ වුවද මෙම ඡේදයේ මීට පෙරාතුව දක්වා ඇති විධිවිධාන නොතිබෙන්නට වැන්දඹු පුරුෂයාට හිමිකම් ඇති විය හැකිව තිබූ සම්පූර්ණ විශ්‍රාම වැටුප හෝ ඉන් යම් කොටසක් හෝ ඔහුට ගෙවන ලෙස අධ්‍යක්ෂ විසින් තම අභිමතය පරිදි විධානය කළ හැකි වන අතර, ඒ අන්දමට අධ්‍යක්ෂ විධානය කරන කල්හි, වැන්දඹු පුරුෂයා ඒ අනුව ගෙවීම ලැබීමට හිමිකරුවෙක් වන අතර මේ නියෝගයන්හි කාර්යයන් සඳහා අර්ථලාභියෙක් ද වන ලෙස සැලකිය යුතුයි.

(2) මෙම නියෝගයේ (1) වන ඡේදයට අනුකූලව අධ්‍යක්ෂ විසින් දෙනු ලැබූ විධානයක බලය අනුව, විශ්‍රාම වැටුපෙන් කොටසක් පමණක් වැන්දඹු පුරුෂයාට ගෙවිය යුතු වූ අවස්ථාවක, එම විශ්‍රාම වැටුපේ ඉතිරි කොටස වෙනත් අර්ථලාභියකු සිටිනම් ඔහුට හෝ අර්ථලාභීන් දෙදෙනකු හෝ ඊට වැඩි ගණනක් සිටී නම්, සම කොටස්වලින් එම අර්ථලාභීන්ට හෝ ගෙවිය යුතුය.

27. ස්වාමිපුරුෂයන් දෙදෙනකු හෝ ඊට වැඩි ගණනක් සිටින දායිකාවක කෙරෙහි මෙම නියෝග අදාළවීම මෙහි පහත දක්වා ඇති විධිවිධාන වලට යටත්ව විය යුතුය :-

(1) මෙම නියෝග වල කාර්යයන් සඳහා එබඳු දායිකාවකගේ දැනට පවතින විවාහවලින්, කාලය අනුව ප්‍රථමයෙන් බැඳුන විවාහය පමණක් නිත්‍යානුකූල විවාහය ලෙස සැලකිය යුතුය.

එසේ වුවද, කලින් බැඳුන විවාහයක් දික්කසාදයකින් නිෂ්ප්‍රභකර තිබීමේ හේතුව කරනකොට ගෙන පමණක් එබඳු දායකයකුගේ දැනට පවත්නා විවාහ අතුරින් කාලය අනුව ප්‍රථමයෙන් බැඳුනා සේ සැලකෙන විවාහය එසේ යැයි වලංගු වනුයේ එම දික්කසාදය මෙම නියෝගයේ (2) වන ඡේදය යටතේ වලංගු වන දික්කසාදයක් ලෙස සැලකිය හැකි වන්නේ නම් පමණය.

(2) එවැනි දායිකාවකගේ යම් විවාහයක් නිෂ්ප්‍රභ කෙරෙන දික්කසාදයක්, මෙම නියෝගවල කාර්යයන් සඳහා වලංගු දික්කසාදයක් ලෙස සලකනු ලබන්නේ මොන අවස්ථාවක දී හෝ එම දික්කසාදයට කලින් දායිකාවගේ වෙනත් විවාහයක් අවලංගු කෙරෙන දික්කසාදයක් නොවූයේ නම් පමණකි.

(3) යම් තැනැත්තකු සමග ඇතිකරගත් එවැනි දායිකාවකගේ විවාහයක් ඇගේ ජීවිත කාලය තුළ තිබි අවස්ථාවක දී මෙම නියෝගයේ (1) වන ඡේදයේ අර්ථය අනුව වලංගු විවාහයක් ලෙස සලකනු ලැබිය නොහැකි විට, එවැනි යම් ස්වාමිපුරුෂයකුට මේ නියෝගය යටතේ විශ්‍රාම වැටුපක් ප්‍රදානය නොකළ යුතු ය.

28. (1) වැන්දඹු පුරුෂයකුට ගෙවිය යුතු විශ්‍රාම වැටුප්, වැන්දඹු පුරුෂයා වෙනුවෙන්, යෝග්‍ය වූ ද පුද්ගලයකුට අධ්‍යක්ෂ විසින් ගෙවිය හැකිය. විශ්‍රාම වැටුප එසේ ගෙවනු ලබන කල්හි විශ්‍රාම වැටුප ලබන පුද්ගලයා විසින් එම විශ්‍රාම වැටුප වැන්දඹු පුරුෂයාගේත්, ඔහු මිය යාමේ දී මෙම නියෝග යටතේ විශ්‍රාම වැටුපක් ලැබීමට හිමිකම් ඇතිවිය හැකි ඇයගේ දරුවකු හෝ දරුවන් ඇත්නම් ඔවුන්ගේ නඩත්තුව ආධාරය හා යහපත සඳහා අධ්‍යක්ෂ විසින් තීරණය කළ හැකි නියමයන් හා කොන්දේසිවලට අනුකූලව යෙදවිය යුතුය.

(2) මෙම නියෝග යටතේ විශ්‍රාම වැටුපක් ලබන වැන්දඹු පුරුෂයෙක්, ඔහු මියයෑමේ දී මෙම නියෝග යටතේ විශ්‍රාම වැටුපක් ලැබීමට හිමිකම් ඇතිවන දරුවකු අත්හළ බවට හෝ අසරණ කළ බවට හෝ ඔහුගේ වත්කම් පමණින් ආධාර නොකළ බවට අධ්‍යක්ෂ සෑහීමට පත් වූ කළ, අධ්‍යක්ෂ විසින් ඔහුගේ පරම අභිමතය මත වැන්දඹු පුරුෂයාගේ විශ්‍රාම වැටුපෙන් සුදුසු යැයි සිතන කොටසක් එම දරුවාට හෝ එම දරුවා වෙනුවෙන් සුදුසු වූ ද, යෝග්‍ය වූ ද පුද්ගලයකුට හෝ ගෙවිය හැකි අතර, ඊට පසු එසේ ගෙවනු ලැබූ කිසියම් විශ්‍රාම වැටුප් කොටසක් සම්බන්ධයෙන් වැන්දඹු පුරුෂයාට කිසිම හිමිකමක් නොතිබිය යුතුය.

(3) මෙම නියෝගයේ (2) වන ඡේදය යටතේ වැන්දඹු පුරුෂයකුගේ විශ්‍රාම වැටුපෙන් යම්කිසි කොටසක් වැන්දඹු පුරුෂයාගේ දරුවා වෙනුවෙන් යම්කිසි පුද්ගලයකුට ගෙවනු ලබන කළ, ඒ දරුවාගේ නඩත්තුව ආධාරය හෝ යහපත සඳහා අධ්‍යක්ෂ විසින් තීරණය කළ හැකි නියමයන් හා කොන්දේසිවලට අනුකූලව එම පුද්ගලයා විසින් එය යෙදවිය යුතුය.

(4) මෙම නියෝග යටතේ දරුවකුට ගෙවිය යුතු විශ්‍රාම වැටුපක්, කෙළින්ම එම දරුවා හට හෝ නිලනාමයෙන් හැඳින්වෙන පදවියක් දරන්නකු හට හෝ අධ්‍යක්ෂ විසින් මෙම කාර්ය සඳහා පත්කරනු ලැබිය හැකි වෙනත් පුද්ගලයකු හට හෝ ගෙවිය හැකිවේ. එපරිදි පත්කරනු ලබන පුද්ගලයකු හට එම විශ්‍රාම වැටුප ගෙවනු ලබන කළ ඒ දරුවාගේ නඩත්තුව ආධාරය හෝ යහපත සඳහා අධ්‍යක්ෂ විසින් තීරණය කළ හැකි නියමයන් හා කොන්දේසිවලට අනුව එම පුද්ගලයා විසින් එය යෙදවිය යුතුය.

29. (1) අනත්දරුවන් සඳහා ගෙවිය හැකි විශ්‍රාම වැටුප් නතර කළ යුත්තේ පිරිමි දරුවකු සඳහා නම් වයස අවු. 21 සම්පූර්ණ කළ විට වන අතර ගැහැණු දරුවකු සඳහා නම් විවාහවීමේ දී හෝ වයස 21 සම්පූර්ණ කළ විට යන මින් කවර අවස්ථාවක් කලින් ඇතිවන්නේද, එවිටය :-

(2) එසේ වුවද 1998.12.28 දිනට පසු වයසින් අවුරුදු 21 හෝ ඊට වැඩි වූ පුරුෂ අනත්දරුවකු හෝ අවිවාහක ස්ත්‍රී අනත්දරුවකු හෝ රැකියා විරහිතව සිටින සාක්ෂි කර ඔහු හෝ ඇය වයසින් අවුරුදු 26 වන තුරු විශ්‍රාම වැටුප් ලැබීමට හිමිකම් තිබිය යුතුය.

(3) සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පත්කරනු ලබන වෛද්‍ය නිලධරයන් තුන් දෙනෙකුගෙන් සමන්විත වෛද්‍ය පරීක්ෂණ මණ්ඩලයක් විසින්, අනත්දරුවකු ඔහුගේ / ඇයගේ ජීවනෝපාය සලසා ගැනීමට නොහැකි වන්නා වූ ශාරීරික හෝ මානසික අශක්තතාවකින් පෙලෙන බවට තීරණය කරන අවස්ථාවක ඒ අනත් දරුවාගේ වයස ගැන නොතකා, මේ නියෝග යටතේ යාවජීව විශ්‍රාම වැටුපක් ලැබීමට හිමිකම් තිබිය යුතුය.

30. (1) දරුකමට ළමයින් හදාගැනීමේ ආඥාපනතේ (61 වන අධිකාරය) විධිවිධාන යටතේ හෝ ළමයින් දරුකමට හදාගැනීම සම්බන්ධයෙන් වූ වෙනත් යම්කිසි නීතියක් යටතේ හෝ විවාහක දායිකාවක විසින් ඇය සන්නද්ධ බලසේනාවන්හි සාමාජිකාවකව්ම අවසන්වීමට පෙර දරුකමට හදාගත් දරුවකු මෙම නියෝගවල (2) වන හා (3) වන ඡේදයේ නියම කරන ලද විධිවිධානයන්ට යටත්ව, දරුකමට හදාගනු ලැබූ තැනැත්තියගේ දරුවකු ලෙස සැළකිය යුතු අතර, ඒ අනුව ළමයා දරුකමට හදාගැනීමට නිරවිතර අධ්‍යාපයක් නොමැති බව සහ එය නුසුදුසු පහසුකම් නිසා දරුකමට හදාගැනීමක් බව විශ්වාස කිරීමට අධ්‍යක්ෂවරයාට හේතු ඇත්නම් මිය එබඳු දරුවකුට මෙම නියෝග යටතේ එබඳු දායිකාවකගේ දරුවකුට මෙන් ඒ අන්දමටම හා ඒ හා සමාන ප්‍රමාණයෙන් විශ්‍රාම වැටුපකට හිමිකම් ඇතිවිය යුතුය.

(2) දරුකමට ළමයින් හදාගැනීමේ ආඥාපනතේ (61 වන අධිකාරය) විධිවිධාන යටතේ හෝ ළමයින් දරුකමට හදාගැනීම සම්බන්ධයෙන් වූ වෙනත් යම්කිසි නීතියක් යටතේ හෝ විවාහක දායිකාවක විසින් ඇය සන්නද්ධ බලසේනාවන්හි සාමාජිකාවකව්ම අවසන්වීමට පෙර දෙදෙනකු හෝ ඊට වැඩි දරුවන් ගණනක් හදාගනු ලබන කල්හි එබඳු දරුවන් හට මෙම නියෝග යටතේ විශ්‍රාම වැටුපකට හිමිකම් ඇති නොවිය යුතුය. එනමුත් අධ්‍යක්ෂගේ එකඟත්වය ඇතිව සාධාරණ හා යුක්ති සහගත වන විශ්‍රාම වැටුපක් එබඳු දරුවන් වෙත ප්‍රදානය කළ හැකිය.

(3) දරුකමට ළමයින් හදාගැනීමේ ආඥාපනතේ (61 වන අධිකාරය) විධිවිධාන යටතේ හෝ ළමයින් දරුකමට හදා ගැනීම සම්බන්ධයෙන් වූ වෙනත් යම්කිසි නීතියක් යටතේ හෝ විවාහක දායිකාවක විසින් ඇය සන්නද්ධ බලසේනාවන්හි සාමාජිකාවීම අවසන්වීමට පෙර දරුකමට හදාගත් දරුවකුට, එම දරුවා දරුකමට හදාගැනීමට ගත් දිනයෙන් පසු එක් අවුරුද්දක් ඇතුළත එබඳු දායිකාව මියගියේ නම් මෙම නියෝග යටතේ විශ්‍රාම වැටුපක් හිමි නොවිය යුතුය. එනමුත් අධ්‍යක්ෂගේ එකඟත්වය ඇතිව, සාධාරණ හා යුක්තියගහගත වන විශ්‍රාම වැටුපක් එබඳු දරුවකු හට ප්‍රදානය කළ හැකිය.

31. දායිකාවකගේ විවාහය බලපවත්වන ඉසාවියම තීන්දු ප්‍රකාශයක් මගින් අවලංගු කළ කල්හි හෝ නිෂ්ප්‍රභ කළ කල්හි මෙම නියෝග වල කාර්යයන් සඳහා ඇය වැන්දඹුවක ලෙස සැලකිය යුතුය.

32. (1) සේවයෙන් විශ්‍රාමගැනීම, අස්කිරීම, ඉල්ලාඅස්වීම, පහකිරීම හෝ වෙනයම් කරුණක් හේතුකොට ගෙන දායිකාවක සන්නද්ධ බලසේනාවන්හි සාමාජිකාවක වීම නතරවන දින දී අවිවාහකයෙකු වන කල්හි විශ්‍රාම වැටුප් ක්‍රමයට අයවිය යුතු යම්කිසි මුදලක් වේ නම් එය අවුකර, ඇයගේ දායක මුදල් වර්ෂයකට සියයට 2 1/2 බැගින් වූ වැල්පොලිය සමඟ ඇය වෙත ආපසු ගෙවිය යුතුය.

(2) ඉහත කී පරිදි ආපසු ගෙවීමක් කළ කල්හි විශ්‍රාම වැටුප් ක්‍රමය සම්බන්ධයෙන් ඇයගේ අයිතිය නිම විය යුතු වන අතර විශ්‍රාම වැටුප් ක්‍රමය සඳහා ඇයට කිසිම හිමිකමක් ඇති නොවිය යුතුය.

(3) සන්නද්ධ බලසේනාවන්හි සාමාජිකාවක වශයෙන් සිටින තුළ අවිවාහකව මරණය සිදුවුවහොත්, මෙම නියෝගයේ (1) වන ඡේදයේ ඇති විධිවිධාන යටතේ ගෙවිය යුතු මුදල, ඇයගේ නීත්‍යානුකූල උරුමක්කාරයන්හට ගෙවිය යුතුය.

(4) සන්නද්ධ බලසේනාවන්හි සාමාජිකාවක සිටීම නිමවීමෙන් පසුව එහෙත් මෙම නියෝගයේ (1) වන ඡේදයේ ඇති විධිවිධාන යටතේ කිසියම් මුදලක් ආපසු ලැබීමට පෙර අවිවාහකව මරණයට පත්වන කල්හි එසේ ආපසු ගෙවීමට ඇති මුදල ඇයගේ නීත්‍යානුකූල උරුමක්කාරයන්හට ගෙවිය යුතුය.

33. (1) සේවයෙන් විශ්‍රාමගැනීම, අස්කිරීම, ඉල්ලාඅස්වීම, පහකිරීම හෝ වෙනයම් කරුණක් හේතුකොටගෙන දායිකාවක සන්නද්ධ බලසේනාවේ සාමාජිකාවකවීම නිමවන දින, විශ්‍රාම වැටුප් ලැබිය හැකි වයසේ දරුවන් නොමැති වැන්දඹුවක වේනම්, ආපසු ගෙවිය හැකි ඇයගේ දායක මුදල් මුළුමනින්ම, එම දායක මුදලට වර්ෂයකට සියයට 2 1/2 බැගින් වූ වැල් පොළිය ද සමඟ ඇය වෙත ආපසු ගෙවිය යුතුය.

(2) විශ්‍රාම වැටුප් ලැබිය හැකි වයසේ දරුවන් නොමැති වැන්දඹුවක සන්නද්ධ බලසේනාවන්හි සාමාජිකාවක ලෙස සේවයේ යෙදී සිටින අතර මිය ගියහොත් ආපසු ගෙවිය හැකි ඇයගේ දායක මුදල් මුළුමනින්ම එම දායක මුදලට වර්ෂයකට සියයට 2 1/2ක් බැගින් වූ වැල් පොළිය ද සමඟ ඇයගේ දරුවන් අතර සම කොටස්වලින් ගෙවිය යුතු අතර, එබඳු දරුවන් නොමැතිකල එය ඇයගේ නීත්‍යානුකූල උරුමක්කාරයන්ට ගෙවිය යුතුය.

(3) විශ්‍රාම වැටුප් ලැබිය හැකි වයසේ දරුවන් නොමැති වැන්දඹුවක සන්නද්ධ බලසේනාවන්හි සාමාජිකාවක සිටීම නිම කිරීමෙන් පසුව එනමුත් මෙම නියෝගයේ (1) වන ඡේදය යටතේ ඇයට හිමිකම් ඇතිව තිබෙන මුදල් කිසිවක් ආපසු ලබන්ට පෙර මරණයට පත්වන කල්හි, ආපසු ගෙවන්නට වන මුදල් ප්‍රමාණය, සම කොටස්වලින් ඇයගේ නීත්‍යානුකූල දරුවන් හට ගෙවියයුතු වන අතර එබඳු දරුවන් නොමැතිකල ඇයගේ නීත්‍යානුකූල උරුමක්කාරයන්ට ගෙවිය යුතුය.

(4) විශ්‍රාම වැටුප් ලැබිය හැකි වයසේ දරුවන් නොමැති වැන්දඹුවක සම්බන්ධයෙන් වන 'ආපසු ගෙවිය හැකි දායක මුදල්' යන පාඨයෙන් අදහස් කරනු ලබන්නේ ඇයගේ ස්වාමියාට හෝ ඇයගේ දරුවන්ට හෝ වයසින් බාලම දරුවාට විශ්‍රාම වැටුප් ලැබීමේ හිමිකම් නැති වූ දින යන දින් කවර දිනයක් පසුව වන්නේ ද එදින සිට මෙම නියෝගය යටතේ ඇයගේ වැටුපෙන් ගෙවා ඇති දායක මුදල් වේ.

(5) මෙම රෙගුලාසිවලට පටහැනිව කුමක් සඳහන් වුව ද දරුවන් නොමැති වැන්දඹුවක් වූ දායිකාවක 1990.01.01 දින හෝ එදිනට පසු මියයාම, සේවයෙන් විශ්‍රාමගැනීම, අස්කිරීම, පහකිරීම හෝ වෙනයම් කරුණක් හේතුකොට ගෙන සන්නද්ධ බලසේනාවේ සාමාජිකාවකවීම අවසන් වූ අවස්ථාවක අවස්ථාවෝචිත පරිදි ඒ දායිකාව හෝ ඒ දායිකාවගේ නීත්‍යානුකූල නියෝජිතයාට ඇයගේ දායක මුදල්, ඒ මත අවුරුද්දට 2 1/2%ක වැල් පොලියක් සමඟ ආපසු ලබාගැනීමට හිමිකම් ලබන්නේය.

(34) (1) විවාහක දායකයකු දුබලතා හේතුව මත හැර වෙනත් ඕනෑම හේතුවක් උඩ සන්නද්ධ සේවාවන්හි සාමාජිකයකු වීම නතරවූ හෝ සේවා විශ්‍රාම වැටුපක් ලැබීමට ඇය සුදුසු නොවූවහොත් මෙම නියෝගයන් යටතේ ඇය විසින් ගෙවා ඇති දායක මුදල් මුළුමනින්ම ...යක් නොමැතිව ආපසු ගෙවිය යුතුය. තවද එබඳු තැනැත්තියකට ද ඇය මඟින් හෝ ඇය යටතේ හිමිකම් ඉල්ලා සිටින සියළුම පුද්ගලයන්ටද ... වැටුප් ක්‍රමය සම්බන්ධයෙන් අයිතිය අහිමිවන අතර විශ්‍රාම වැටුප් ක්‍රමය යටතේ කිසිම ගෙවීමක් සඳහා සුමන විධියකට හෝ හිමිකමක් ...ව අයත් නොවිය යුතුය.

(2) මෙම නියෝගයේ (1) වන ඡේදයේ විධිවිධාන යටතේ යම් තැනැත්තියකට හිමිව ඇති දායක මුදල් ලබාගැනීමට පෙර ඇය මියයන කල්හි, ආපසු ගෙවන එම මුදල, පහත දැක්වෙන පරිදි ගෙවිය යුතුය:–

(අ) එම මුදලෙන් එක් භාගයක් ඇයගේ වැන්දඹු පුරුෂයාට ද අනික් භාගය සම කොටස්වලින් ප්‍රක්තව ඇයගේ නීත්‍යානුකූල දරුවන්ට ද ගෙවිය යුතුය. දායිකාවගේ යම්කිසි නීත්‍යානුකූල දරුවකු ඇයට උපන් දරුවා සිටිය දී දායිකාව මියයෑමට පෙර මිය ගියහොත් එබඳු දරුවකු සතු කොටස සම කොටස්වලින් ප්‍රක්තව මිය ගිය එම දරුවාගේ දරුවන්ට ගෙවිය යුතුය.

(ආ) වැන්දඹු පුරුෂයකු හෝ දරුවන් හෝ සිටිය දී දායිකාව මියගියහොත්, ආපසු ගෙවනු ලබන සියලු මුදල්, අවස්ථාවෝචිත පරිදි, එබඳු වැන්දඹු පුරුෂයකුට හෝ දරුවන්ට හෝ ගෙවිය යුතුය.

(ඇ) වැන්දඹු පුරුෂයෙක් හෝ දරුවන් නොමැතිව දායිකාව මිය ගියහොත් ආපසු ගෙවනු ලබන මුදල් ඇයගේ නීත්‍යානුකූල උරුමක්කාරයාට හෝ උරුමක්කාරයින්ට ගෙවිය යුතුය.

35. මෙම නියෝග යටතේ දායිකාවකගෙන් හෝ මියගිය දායිකාවකගෙන් අයවිය යුතු යම්කිසි මුදලක් හෝ වෙනත් මුදලක් වේනොත් විශ්‍රාම වැටුප් ක්‍රමයෙන් එබඳු දායිකාවක වෙත හෝ එබඳු දායකයකු වෙනුවෙන් ගෙවීමට ඇති යම්කිසි මුදලකින් අඩුකර ගත හැකිය. මෙම ...ග යටතේ දායිකාවකගේ වැන්දඹු පුරුෂයාගෙන් හෝ දරුවාගෙන් විශ්‍රාම වැටුප් ක්‍රමයට අයවිය යුතු කිසියම් මුදලක් වේනොත්, එය, එබඳු ...දඹු පුරුෂයකුට හෝ දරුවාට හෝ එබඳු වැන්දඹු පුරුෂයකු වෙනුවෙන් හෝ දරුවා වෙනුවෙන් හෝ ගෙවිය යුතු යම්කිසි විශ්‍රාම වැටුපකින් අඩු කර ගත හැකිය.

36. මෙම නියෝගවල අර්ථකථනය ඇතුළුව, යම් තැනැත්තියක දායිකාවක ද යන්න සම්බන්ධයෙන් හෝ දායිකාවකගේ වැන්දඹු පුරුෂයකු දරුවකු ... යන් යම්කිසි පුද්ගලයකුට යම්කිසි විශ්‍රාම වැටුපකට හිමිකම් ඇත්තේ ද යන්න සම්බන්ධයෙන් හෝ යම්කිසි වැන්දඹු පුරුෂයකුට දරුවකුට හිමිවිය හැකි විශ්‍රාම වැටුප් මුදල සම්බන්ධයෙන් හෝ මෙම නියෝගවල යම්කිසි විධිවිධානයන්ට දිය යුතු අර්ථය හෝ අර්ථ නිරූපණය ...න්ධයෙන් හෝ යම්කිසි ප්‍රශ්නයක් පැන නැඟුනහොත්, එය, හමුදාධිපතිවරයා විසින් ඔහුගේ මූලිකත්වය උඩ හා එබඳු දායිකාවකගේ හෝ වැන්දඹු ...යකුගේ හෝ දරුවකුගේ ලිඛිත ඉල්ලීම් අනුව එවැනි ප්‍රශ්නයක් සම්බන්ධයෙන් තීරණයක් ගැනීම සඳහා, අධ්‍යක්ෂ මඟින් රාජ්‍ය පරිපාලන, විෂයභාර ...නාවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත ඉදිරිපත් කළ යුතු අතර, ඒ සම්බන්ධයෙන් රාජ්‍ය පරිපාලන, විෂයභාර අමාත්‍යාංශයේ ලේකම්ගේ ...ය අවසාන තීරණ විය යුතුය.



# பகுதி I : தொகுதி (I) – பொது

## அரசாங்க அறிவித்தல்கள்

8 ஆம் ஆண்டின் 60 ஆம் இலக்க விதுரர், அநாதைகள் ஓய்வூதியத் திட்டம் (ஆயுதம் தாங்கிய படைகள்) சட்டம்

1 ஆம் ஆண்டின் 60 ஆம் இலக்க விதுரர், அநாதைகள் ஓய்வூதியத் திட்ட (ஆயுதம் தாங்கிய படைகள்) சட்டத்தின் 05 ஆம், ஆம் பிரிவுகளின் மூலம் அவருக்கு உரித்தாக்கப்பட்ட தத்துவங்களின் பயனைக்கொண்டு பொது நிருவாக, உள்நாட்டலுவல்கள், பாகச் சீர்திருத்த அமைச்சரினால் வெளியிடப்பட்ட ஒழுங்குவிதிகள்.

ரிச்சர்ட் பத்திரண,
பொது நிருவாக, உள்நாட்டலுவல்கள், நிர்வாகச் சீர்திருத்த அமைச்சர்.

...ழும்பு,
11.04.11.

2 – H 011484 – (2001/04)